# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

## ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන)

**2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

මුදල් අමාත්‍යතුමා විසින් 2019 අගෝස්තු මස 20 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2019 ජූලි මස 31 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

**[294 වන පනත් කෙටුම්පත]**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 12.00** **තැපැල් ගාස්තුව : රු. 15.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

***2 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනතේ 3 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තියේ නීතියේ බලපෑම වනුයේ නිශ්චිතව සඳහන් කරන ලද ශීර්ෂ අංක යටතේ හඳුනාගනු ලැබුවා වූ ඇතැම් සිගරට් සඳහා ලබාදුන් නිදහස් කිරීමේ කාලසීමාව සීමා කිරීම වේ.

***3 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතියේ බලපෑම වනුයේ-

(අ) නිශ්චිතව සඳහන් කරන ලද ශීර්ෂ අංක යටතේ හඳුනාගනු ලැබුවා වූ ඇතැම් සිගරට් සඳහා ලබාදුන් නිදහස් කිරීමේ කාලසීමාව සීමා කිරීම;

(ආ) අපනයනය කරන ලද මැණික් සඳහා අදාළව දැනට පවතින නිදහස් කිරීමේ නිර්ණායක ප්‍රතිශෝධනය කිරීම;

(ඇ) ඇතැම් නව ද්‍රව්‍යයන් ආනයනය කිරීම සඳහා නිදහස් කිරීම දීර්ඝ කිරීම; සහ

(ඈ) ඇතැම් සේවා සඳහා ලබාදුන් නිදහස් කිරීමේ කාලසීමාව සීමා කිරීම,

යනාදිය සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

## ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන)

එල්.ඩී.-ඕ. 9/2019

**2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2019 අංක   දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, මේ යටතේ වෙනස් වූ බලාත්මක වීමේ දින නිශ්චිතව සඳහන් කරනු ලබන්නේ නම් මිස, 2009 ජූලි මස 1 වන දින සිට බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

2009 අංක 9 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

**2.** 2018 අංක 20 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනතේ 3 වන වගන්තිය, එහි (2) වන උපවගන්තියෙහි (iv) වන ඡේදයෙහි, (12) වන උපඡේදයේ "ආනයනකරු විසින් ම" යන වචන වෙනුවට "2019 ජූලි මස 1 වන දිනට පෙරාතුව, ආනයනකරු විසින් ම," යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.

**3.** 2018 අංක 20 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය පහත දැක්වෙන පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම උපලේඛනයේ I වන කොටසේ-

(අ) (XLIX) අයිතමයේ "රේගු කාර්ය සඳහා" යන වචන වෙනුවට, "2019 ජූලි මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් කාල පරිච්ඡේදයක් වෙනුවෙන් රේගු කාර්ය සඳහා" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ආ) (LIV) අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:-

"(LIV) ජාතික මැණික් හා ස්වර්ණාභරන අධිකාරිය වෙත ලියාපදිංචි වූ තැනැත්තකු විසින් කපා ඔප දමා ප්‍රතිඅපනයනය කිරීමේ කාර්යය සඳහා මැණික් ගල් ආනයනය කිරීම;";

(ඇ) (LV) අයිතමයේ "ද්‍රව්‍ය ආනයනය කිරීම" වෙනුවට "ද්‍රව්‍ය ආනයනය කිරීම;" යන වචන ආදේශ කිරීමෙන්;

(ඈ) (LV) අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතම එකතු කිරීමෙන්:-

"(LVI) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ බදු අය කරනු ලැබූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්දට යටත්ව ආනයනය කරන ලද ෆාම් තෙල්වලින් දේශීයව නිපදවනු ලබන ෆාම් තෙල්;

(LVII) ලූසන් (ඇල්ෆැල්ෆා) ආහාර සහ ගුළි ආනයනය කිරීම; සහ

(LVIII) රේගු කාර්ය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද ශීර්ෂ අංක 8903.91.00 යටතේ වර්ගීකරණය කරන ලද පරිදි විනෝදය සඳහා හෝ ක්‍රීඩා සඳහා වූ යොට් යාත්‍රා සහ වෙනත් යාත්‍රා, කුඩා හබල් ඔරු සහ කැන්වස් ආනයනය කිරීම.".

(2) එම උපලේඛනයේ II වන කොටසේ-

(අ) (vii) වන අයිතමයේ-

(i) (ඇ) ඡේදයේ "ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවකු හෝ උප කොන්ත්‍රාත්කරුවකු සලසන සේවා" යන වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන්:-

"ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවකු හෝ උප කොන්ත්‍රාත්කරුවකු සලසන ලද සේවා; හෝ ";

(ii) (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(ඈ) 2019 ජූලි මස 1 වන දින හෝ එදිනට පසු ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවකු හෝ උප කොන්ත්‍රාත්කරුවකු සලසනු ලබන සේවා;"; සහ

(ආ) (xii) අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:-

"(xii) යම් හෝටලයක්, අමුත්තන්ගේ නිවාසයක්, ආපන ශාලාවක් හෝ ඒ හා සමාන වෙනත් ව්‍යාපාරයක් ලංකා සංචාරක මණ්ඩලය වෙත ලියාපදිංචි කර ඇත්නම් එම හෝටලය, අමුත්තන්ගේ නිවාසය, ආපනශාලාව හෝ වෙනත් සමාන ව්‍යාපාරය විසින්-

(අ) 2011 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව ලබා දෙන ලද සේවා; හෝ

(ආ) ශ්‍රී ලංකාවේ බැංකුවක් හරහා විදේශීය ව්‍යවහාර මුදලින් තත් සේවා සඳහා ගෙවීම් කරන අවස්ථාවක දී 2019 ජූලි මස 1 වන දින හෝ ඊට පසු ලබා දෙනු ලබන සේවා ;".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**4.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.